34 වන පිටෙන්

ඒ ගිම්හාන කාලය සතුටින් පිරුණු එකක් වුණා!

ඒ කට්ටිය ජීවත්වුණු ගෙදර කිට්ටුව පුංචි කැලයක් තිබුණා. ජූනි මාසයේ දිග හවස් වරු වල දී, හවස තේ වේලාවෙන් පස්සේ ඒ කැලයට සෙල්ලම් කරන්න යන්න ළමයා බොහොම ප්‍රිය කළා. මෙහෙම යද්දී එයා විල්ලුද හාවාත් අරගෙන ගියා. කැලේ තැන තැන ඇවිදලා මල් කඩලා එකතුකරන්න යන වෙලාවට, එහෙම නැත්නම් ගස් අතරේ සොල්දාදු සෙල්ලමට යන වෙලාවට ළමයා හාවාට කොළ රොඩු එකතු කරලා පුංචි කැදැල්ලක් හදලා දුන්නා. මෙහෙම කළේ එයා බොහොම හිත හොඳ කෙනෙක් නිසායි. එක හවසක හාවා මෙහෙම වාඩිවෙලා තමන්ගේ විල්ලුද අත් දෙක මැද්දෙන් එහාට මෙහාට යන කූඹි දිහා බලාගෙන ඉන්දැද්දි කිට්ටුව තිබුණු උස පඳුරක් අතරින් අමුතු සත්තු දෙන්නෙක් හෙමින් මතුවෙනවා දැක්කා.

ඒ හිටියේත් තමන් වගේම හාවෝ තමයි, ඒත් අයට හොඳට ලොම් තිබුණා, අලුත් පාටක් පෙනුණා. ඒ හාවෝ දෙන්නාගේ කිසිම මූට්ටුවක් නොපෙනුණ නිසා උන්ට හොඳ නිමාවක් තිබුණු බවක් පෙනුණා. එහෙ මෙහෙ යද්දී ඒ දෙන්නාගේ හැඩය අමුතු විදිහකට වෙනස් වුණා. තමන් වගේ හැමතිස්සෙම එකම හැඩයකට නැතිව ඒ අය එක මොහොතක් හීනියට දිගට පෙනුණා, ඊළඟ මොහොතේ මහතට, රවුමට පෙනුණා. හෙමින් අඩි තියමින්, නහයවල් සොලවමින් ඒ අය මේ හාවා ළඟටම ආවා. සාමාන්‍යයෙන් දුවන පනින අය එහෙම හෙලවෙන්නේ යතුරකින් දඟ කැව්වාට පස්සේ බව දැනගෙන උන්නු හාවා ඒ දෙන්නාගේ යතුරු තිබුණු තැන හරියටම දැකගන්න මහන්සි වුණා, ඒත් එහෙම දෙයක් දකින්න ලැබුණේම නැහැ. පෙනුණ විදිහට මේ අලුත්ම ජාතියේ හාවෝ දෙන්නෙක්.

උන් නහයවල් සොලවමින් පුංචි හාවා දිහා බලාගෙන හිටියා, එයාත් ආපිට ඒ අය දිහා බලාගෙනම හිටියා.

"ඇයි ඔයා නැගිටලා ඇවිත් අපි එක්ක සෙල්ලම් නොකරන්නේ?ඟ එක හාවෙක් ඇහුවා.

"මට සෙල්ලම් කරන්න හිතක් නැහැ'' තමන්ට දඟ කවන කොටස් නැති බව කියන්න අකමැති නිසා හාවා එහෙම උත්තර දුන්නා.

"හෝ! ඒක හරි ලේසි වැඩක්'' ලොම් පිරුණු හාවා එහෙම කියලා පැත්තට පිම්මක් පැනලා තමන්ගේ පස්සා ගාත් දෙකෙන් හිටගත්තා. "මම හිතන්නේ නැහැ ඔයාට පුළුවන් කියලා!''

"මට පුළුවන්!'' පුංචි හාවා කීවා. "මට ඕනෑ තරම් උසට පනින්න පුළුවන්!'' එයා එහෙම කියද්දී අදහස් කළේ ළමයා තමන්ව උඩට වීසි කළාම එහෙම පනින්න පුළුවන් බව. ඒත් ඒ බවක් කියන්න එයාට වුවමනාවක් තිබුණේ නැහැ.

"ඔයාට පුලුවන්ද පස්සා ගාත් වලින් උඩ පනින්න?'' ලොම් පිරුණු හාවා ඇහුවා.

ඒක හරි දරුණු ප්‍රශ්නයක්. ඒකට හේතුව විල්ලුද හාවාට පස්සා ගාත් තිබුණේම නැහැ! එයාගේ පිටිපස්සේ කොටස අල්පෙනිති ගහන කොට්ටයක් වගේ තනිකරම රවුමට මහලා තිබුණේ. හාවා හෙලවෙන්නේ වත් නැතිව කොළ රොඩු අතරේ වාඩිවෙලා හිටියේ මේ බව අනෙත් හාවෝ නොදකියි කියන බලාපොරොත්තුවෙන්.

"මට එහෙම කරන්න ඕනෑකමක් නැහැ!'' එයා ආයෙත් වතාවක් කීවා.
ඒත් කැලේ හාවොන්ට හොඳ තියුණු ඇස් තිබුණා. ඉන් එක හාවෙක් බෙල්ල දිගඇරලා හොඳට බැලුවා.

"එයාට පස්සා ගාත් නැහැ!'' එයා කෑගහලා කීවා. "හිතලා බලන්නකෝ.. පස්සා ගාත් නැති හාවෙක්!'' එහෙම කියලා එයා හිනා-වෙන්න පටන් ගත්තා.

"මට පස්සා ගාත් තියෙනවා!'' පුංචි හාවා කෑගහලා කිව්වා. "මම ඒවා උඩ වාඩිවෙලා ඉන්නේ!''

"එහෙනම් ඒවා මේ විදිහට දිග ඇරලා මට පෙන්නන්න!'' කැලෑ හාවා කිව්වා. එහෙම කියලා කැරකි කැරකි නටන්න පටන්ගත්තා. ඒක බලාගෙන ඉඳලා පුංචි හාවාට කැරකිල්ලත් හැදුණා.

"මම කැමති නැහැ නටන්න'' එයා කීවා. "මම වැඩියම කැමති දඟලන්නේ නැතිව ඉන්න,

ඒත්, එහෙම කියද්දීත් එයාට නටන්න හරි ආසාවක් දැනුණා. එයාගේ ඇඟ ඇතුලේ අලුත්ම, අමුතුම කිතියක් දැනුණා. අනෙත් හාවෝ වගේ තමන්ටත් උඩ පනින්න ලැබෙනවා නම් මේ ලෝකේ ඕන දෙයක් ඒ හිලව්වට දෙන්න පුලුවන් බවක් එයාට දැනුණා.

අමුතු හාවා නැටිල්ල නවත්තලා ළඟටම ආවා. කොයිතරම් ළඟට අවාද කියනවානම් උගේ රැවුල් ගස් විල්ලුද හාවා ගේ කණක ගෑවුණා. එයා එකපාරටම නහය රැළි කරලා, කන් දෙක පහත් කරගෙන ආපස්සට පැන්නා.

"මෙයාගෙන් දැනෙන්නේ හරි සුවඳක් නෙමෙයි!'' එයා කෑගැහුවා "මෙයා හාවෙක් නෙමෙයි! එයාට පණ නැහැ!''
"මට පණ තියෙනවා!'' පුංචි හාවා කීවා.
"මට පණ තියෙනවා! ළමයා ඒ බව කීවා!'' එහෙම කියද්දී එයාට ඇඬෙන්නත් ගියා.

ඒ වෙලාවේ අඩි සද්දයක් ඇහුණා, පිරිමි ළමයා එතැනින් දුවලා ගියා. ඒ එක්කම අඩි හප්පලා පුංචි සුදු වලිග ගස්සලා හා අමුත්තෝ දෙන්නාත් අතුරුදහන් වුණා.

"ආයෙත් ඇවිත් මාත් එක්ක සෙල්ලම් කරන්න!□ පුංචි හාවා කෑගහලා කීවා. "අනේ ආයෙත් එන්න. මම දන්නවා මට පණ තියෙ-නවා කියලා!''

ඒත් කිසිම උත්තරයක් ලැබුණේ නැහැ. පුංචි කූඹි ටික විතරක් එහේ මෙහෙ ගියා, අමුත්තෝ දෙන්නා යන්න ගිය තැන තිබුණු පඳුර හෙමින් හෙල්ලුණා. විල්ලුද හාවා තනිවෙලා හිටියා.

"අනේ, ඇයි ඒ අය එහෙම පැනලා ගියේ!'' එයා හිතුවා. "ඇයි නැවතිලා මාත් එක්ක කතා නොකළේ?''

අනෙත් හාවෝ දෙන්නා ආයෙත් එයි කියන බලාපොරොත්තුවෙන් සෑහෙන්න වෙලාව-ක් යනකම් හාවා පඳුරු දිහා බලාගෙන හිසොල්මන් ව හිටියා. ඒත් ඒ අය ආපිට ආවේම නැහැ. ටික වෙලාවකින් ඉර බැහැලා ගිහින් පුංචි සුදු මෙරු එළියට පියාඹලා ආවා, පිරිමි ළමයා ඇවිත් හාවා ව ගෙදර අරගෙන ගියා.

සති ගණනක් ගතවුණා. හාවා එන්න එන්නම පරණ පාට වුණත් පිරිමි ළමයා එයාට තිබුණ ආදරේ අඩුවක් නම් වුණේ නැහැ. ඒ ආදරේ කොයිතරම් ද කියනවානම් එයාගේ රැ වුල් ගස් ගැලවිලා ගියා, කන් දෙකේ රෝස පාට අළු පාටකට හැරුණා, දුඹුරු පුල්ලි මැකිලා ගියා. එයාගේ හැඩයත් වෙනස් වෙලා හාවෙක්ගේ හැඩය නැතිවෙලා ගියා. ඒත් ළමයාට නම් හාවා හැමදාම ලස්සනට පෙනුණා. පුංචි හාවාට වැදගත් වුණේ ඒ බව විතරයි. සෙල්ලම් බඩු කාමරයේ මායා බලයෙන් තමන්ට පණ ලැබුණු නිසා අනෙත් අයට තමන්ව කොහොම පෙනුණත් ඒ ගැන වගක් වුණේ නැහැ. පණ ලැබුණාට පස්සේ තමන් කොයිතරම් කසිකබල් පාට වුණත් කමක් නැහැ කියලා හාවාට හිතුණා.

ඔය අතරවාරයේ දවසක් පිරිමි ළමයා ලෙඩ වුණා.

එයාගේ මූණ හොඳටම රතුවුණා, එයා හින්-දෙනුත් කතා කළා. එයාගේ පුංචි ඇඟ කො-යිතරම් රස්නේ වුණා ද කියනවා නම් හාවා ව තුරුල් කරගෙන ඉන්දැද්දි පිච්චෙනවා වගේ දැනුණා. එක එක විදිහේ අමුත්තෝ නිතරම කාමරයට ඇවිත් ගියා. රෑ එලි-වෙනකල්ම කාමරයේ පහනක් පත්තු වුණා. මේ හැමදෙයක්ම සිද්ධවෙන අතරේදී විල්ලුද හාවා ඇඳ රෙදි යටට වෙලා හෙල්ලෙන්නේ-වත් නැතිව හැංගිලා හිටියා. එහෙම හිටියේ ළමයාට තමන්ව ඕන බව දැනගෙන හිටිය නිසා, තමන්ව කවුරුහරි හොයාගෙන අයින් කරාවි කියලා බයෙන්.

ඒක බොහොම දිග වෙහෙසකර කාලයක්. ළමයා අසනීපෙන් නිසා සෙල්ලම් කළේ නැහැ. හාවාට දවස තිස්සෙම කිසිම දෙයක් නොකර ඉන්න එක හරිම කම්මැලි වැඩක් වුණා. ඒත් එයා බොහොම ඉවසීමෙන් ගුලිවෙලා බලාගෙන හිටියේ ඉක්මණටම ළමයාට සනීප වෙනකම්. ආයෙත් මල්, සමනලයන් පිරුණු ගෙවත්තට යන්නත් රාස්බෙරි පඳුරු අතරේ අපූරු සෙල්ලම් කරන්නත් ලැබෙනකම් එයා මඟ බැලුවා. හාවා එහෙම ඉන්න අතරේ ඉස්සරහට කරන්න බොහොම සොඳුරු දේවල් සැලසුම් කළා. අඩ නින්දේ ඉන්න ළමයාගේ කොට්ටය ලඟට හෙමින් සැරේ ගිහින් එයාගේ කණට කොඳුරලා ඒ සේරම දේවල් කිව්වා. ටික දවසක් යද්දී උණ අඩුවෙලා ළමයාට සනීප වුණා. හාවාත් පැත්තකින් තුරුල් වෙලා ඉන්දැද්දි එයාට ඇඳේ වාඩිවෙලා පින්තූර පොත් බලන්න පුළුවන් වුණා. දවසක් ළමයාට ඇඳෙන් බැහැලා ඇඳුම් මාරු කරගන්න පවා අවසර ලැබුණා.

ලස්සන ඉර එළිය ඉහිරුන උදෑසනක කාමරයේ ජනේල ඇරලා තිබුණේ. පිරිමි ළමයාව පොරෝණයකින් ඔතලා සඳලුතලයට ඔසවාගෙන ගිහින් තිබුණා. පුංචි හාවා ඇඳ රෙදි අතරට වෙලා කල්ප-නා කර කර හිටියේ.

ළමයා හෙට මුහුදු වෙරළ තියෙන පැත්තකට යන්නයි හිටියේ. ඒ වෙද්දී හැම දේම ලෑස්ති කරලා දොස්තරගේ උපදෙස් පිළිපදින්න විතරයි ඉතිරි වෙලා තිබුණේ. ඒ ගැන අනෙත් අය කතා කරද්දී පුංචි හාවා ඇඳ රෙදි යට වැතිරිලා, ඔලුව විතරක් යන්තම් එළියට දාගෙන අහගෙන හිටියා. මුළු කාමරයේම විෂබීජ නැති කරන්නත්, ළමයා අසනීප කාලේ සෙල්ලම් කළ හැම සෙල්ලම් බඩුවක් ම, පොතක්ම පුළුස්සලා දාන්නත් නියමිත වෙලා තිබුණා.

''නියමයි!'' හාවා හිතුවා. ''හෙට අපි මුහුද තියෙන පැත්තට යනවා!'' ළමයා නිතරම මුහුද ගැන කතා කළ නිසා එයාටත් ලොකු රළ පෙරලෙන හැටි, පුංචි කකුළුවෝ, වැලි මාලිගා මේ හැම දෙයක්ම දකින්න ලොකු ආසාවක් තිබුණා.

ඒ වෙලාවේම හාවා ව නැනාගේ ඇහැ ගැටුණා.

''එතකොට මේ පරණ හාවා?'' ඈ ඇහුවා.

''ඕකද?'' දොස්තර ඇහුවා. ''ඕක විෂබීජ ගොඩක් නේ! වහාම පුච්චලා දාන්න. මො-කක්ද? විකාර! එයාට අලුත් එකක් ගෙනත් දෙන්න. ආයෙත් ඕක නම් දෙන්න එපා!''

ඉතින් ඔය විදිහට පරණ පින්තූර පොත් එක්ක වෙනත් කුණු කසල ගොඩාක් පුරවපු ගෝනියකට හාවාත් දාලා වත්තේ කෙළවර කුකුල් කොටුව පිටිපස්සට ගිහින් දැම්මා. ගිණි ගොඩක් ගහන්න එතැන නම් කියාපු තැන, ඒත් උයන්පල්ලාට වෙන වැඩ තිබුණු නිසා ඒ වෙලාවේ ඒක කරන්න ලැබුණේ නැහැ. එවෙලේ අර්තාපල් ගලවන්නයි, බෝංචි අස්වැන්න නෙලන්නයි තිබුණු නිසා පස්සෙන්දා පාන්දරම ඇවිත් ඒ ටික පුළුස-සලා දාන්න එයා පොරොන්දු වුණා.

එදා රෑ පිරිමි ළමයා නිදාගත්තේ වෙන නිදන කාමරයක. එයාට නිදාගනිද්දී ලඟින් තියාග න්න අලුත් හාවෙක් ලැබිලා තිබුණා. සුදු පාට ලොම්, ඇත්තම වීදුරු ඇස් තිබුණු එයා හරිම ලස්සන හාවෙක්. ඒත් ළමයා ලොකු උද්යෝගයකින් හිටිය නිසා අලුත් හාවා ගැන එයාට හිතන්න වෙලාවක් තිබුණේ නැහැ. පස්සෙන්දා මුහුදු වෙරළ පැත්තට යන එක කොයිතරම් අපූරු දෙයක්ද කියනවානම් ළමයාට වෙන කිසි දෙයක් ගැන කල්පනා වුණේ නැහැ.

ඉතින් ළමයා මුහුද ගැන හීන දකිමින් නිදාගෙන ඉන්දැද්දී කුකුල් කොටුව පිටිපස්-සේ පරණ පින්තූර පොත් ගොඩේ වැතිරිලා උන්නු පුංචි හාවාට හරිම තනිකමක් දැනුණා. ගෝනිය ගැටගහලා නොතිබුණු නිසා ඇතුලේ ටිකක් එහා මෙහා වෙලා ගෝනි කටෙන් ඔලුව එලියට දාලා වටපිට බලන්න හාවාට පුළුවන් වුණා. හැමදාම හොඳ ඇඳක නිදාගෙන පුරුදුවෙලා තිබුණු නිසා හාවා හීතලෙන් වෙව්ලුවා. ළමයා තුරුළු කරගෙනම ඉඳලා හාවාගේ ලොම් තට්ටුවත් තුනී වෙලා තිබුණු නිසා එයින් ආරක්ෂාවක් නම් ලැබුණේ නැහැ. හාවාට ළඟින්ම පෙනුණේ නිවර්තන වනාන්තරයක් වගේ උසට හැදුණු රාස්බෙරි පඳුරු ටික. ඒවායේ හෙවනේ ඉස්සර ළමයාත් එක්ක සෙල්ලම් කළ හැටි හාවාට මතක් වුණා. ඉස-සර ඉර එළිය ඉහිරුණ බොහොම දිග පැය ගණන්වල ගෙවත්තේ ගත කළ කාලය මතක් වෙලා, ඒ දවස්වල ඒ දෙන්නා කොයිතරම් සන්තෝසයෙන් හිටියාද මතක් වෙලා හාවට ලොකු දුකක් දැනුණා. මේ හැම සිද්ධියක්ම එකක් අනෙකට වඩා ලස්සනට එයාට මැවී පේන්න පටන් ගත්තා. මල් පාත්තිවල තැනුණු සුරංගනා කුටි, කැලයේ කොළ රොඩු උඩ වැතිරිලා ගත කළ නිහඬ හවස් වරු, තමන්ගේ අත් දෙක උඩින් පුංචි කූඹි එහේ මෙහේ ගිය හැටි, තමන්ට පණ තියෙන බව දැනුණු ඒ සුන්දර දවස.මේ හැම දෙයක්ම එයාට මතක් වුණා. හාවාට හම් අශ්වයාගේ නුවණක්කාර බව, මෘදු බව, එයා තමන්ට කීව දේවල් මතක් වුණා. හැම දේම අවසාන වෙන්නේ මේ විදිහට නම් ආදරයත් ලබලා, තමන්ගේ ලස්සනත් නැතිවෙලා පණ ලැබුණු එකේ ප්‍රයෝජනය මොකක්ද? මේවා හිතද්දී එකම එක කඳුළු බින්දුවක්.ඇත්ත කඳුළු බින්දුවක්.එයාගේ පාට මැකුණු විල්ලුද නහය දිගේ ගලාගෙන ඇවිත් බිමට වැටුණා.

එතකොටම හරිම පුදුම දෙයක් සිද්ධ වුණා. කඳුළු බින්දුව බිමට වැටුණු තැන, ගෙවත්තේ කොහේදී වත් නොදැකපු

42 වන පිටට